# කුඹුරු ඉඩම්වල භෝග විවිධාංගීකරණයත් සමගම සිදු වූ බෙත්ම ක්‍රමයේ වෙනස් වීම

එච්.එම්. සෝමරත්න

**සංක්ෂේපය**

**ජාතික වී නිෂ්පාදනයේ සැලකිය යුතු වර්ධනයක් ඇති වීමත් සමඟ ම අතිරේක භෝග නිෂ්පාදනය වැඩි කිරීම කෙරෙහි රජයේ සැලකිල්ල යොමු විය. මෙහි දී වියළි කාලපයේ වාරි යෝජනා ක්‍රමවල යල කන්නයේදී අතිරේක බෝග වගා කරන ලෙස ගොවීන්ට උපදෙස් දෙන ලදී. ඒ අනුව මෑත කාලයේදී භෝග විවිධාංගීකරණය මැනවින් ව්‍යාප්ත විය. මෙය පාරම්පරික බෙත්ම ක්‍රමයට බලපෑ ආකාරය විමසා බැලීම සඳහා මහවැලි යෝජනා ක්‍රමයේ තෝරාගත් ගමක අධ්‍යයනයක් සිදු කෙරිණි. භෝග විවිධාංගීකරණය නිසා බෙත්ම ක්‍රමය ව්‍යාකූල තත්ත්වයකට පත්ව ඇති බව මෙහිදී හෙළි වූ අතර වගා ළිං හා වතුර පොම්ප භාවිතය නිසා ඇතැම් ගොවීහු බෙත්ම ක්‍රමය නොසලකා හරින බව අනාවරණය විය. තම කුඹුරු ඉඩම්වලින් බෙත්ම කොටස් අන් අයට ලබාදීම ප්‍රතික්ෂේප කිරීම, බෙත්ම ක්‍රමය යටතේ තීරණය කළ ප්‍රමාණයට වඩා වැඩියෙන් වගා කිරීම, සමහර ඉඩම් කොටස් බෙත්ම ක්‍රමයට නොව බද්දට දීම, ආදිය පොදුවේ දක්නට ලැබුණි. එමෙන් ම අතිරේක භෝග වගාව පාරිසරික ගැටලු වලටද හේතු වී ඇති බව දක්නට ලැබුණි. මෙම තත්ත්ව වලක්වා බෙත්ම ක්‍රමය නිසි ලෙස පවත්වාගෙන යාම සඳහා විධිමත් ගොවි සංවිධාන පිහිටුවීම හා ඒවාට අවශ්‍ය නීතිමය බලතල ලබාදීම යෝග්‍ය බව අවධාරණය කළ හැකිය.**

**හැඳින්වීම**

ශ්‍රී ලංකාවේ නිදහසින් පසු බලයට පත් වූ සෑම රජයක් ම වී ගොවිතැන දියුණු කිරීම සඳහා විවිධ පියවර ගෙන ඇත. නව ගොවි ජනපද පිහිටුවීම මගින් වී වගාව සඳහා අලුත් ඉඩම් හඳුන්වා දීම, වාරි පහසුකම් වැඩි දියුණු කිරීම, නව දියුණු කළ බීජ වර්ග හා වගා ක්‍රම ප්‍රචලිත කිරීම හා අනෙකුත් ගොවි ජන සේවාවන් සැපැයීම එබඳු පියවර කිහිපයකි. මේ වැඩ පිළිවෙල නිසා පසුගිය දශක කිහිපය ඇතුළත දේශීය වී නිෂ්පාදනයේ සැලකිය යුතු ප්‍රගතියක් ඇති වූ බව පෙන්වා දිය හැකිය. උදාහරණයක් ලෙස 1951 - 52 මහ කන්නයේ වී වගාවේ ඵලදායිතාව හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 1588ක්වූ අතර එය 1994 - 95 මහ කන්නය වන විට හෙක්ටයාරයකට කිලෝග්‍රෑම 3586ක් දක්වා වැඩි වී ඇත. එමෙන් ම මෙකී කාල සීමාව තුළ දේශීය වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 6030000 සිට මෙට්‍රික් ටොන් 2810000ක් දක්වා ඉහළ ගොස් ඇත. (වී සංඛ්‍යා ලේඛන 1997) මේ නිසා 1985 වන විට ශ්‍රී ලංකාව ස්වකීය අවශ්‍යතාවෙන් 80%ක් පමණ නිපදවා ගන්නා තත්ත්වයට පත් විය. මේ සමඟ ම කුඹුරු ඉඩම්වල මිරිස්, ලූනු ආදි අතිරේක බෝග වගා කර ඒවායේ දේශීය නිෂ්පාදනය වැඩි කිරීම කෙරෙහි ද රජයේ අවධානය යොමු වන්නට විය. මෙයට ප්‍රධාන හේතුවක් වූයේ මෙම අතිරේක ආහාර බෝග ආනයනය කිරීමට රජයට විශාල විදේශ විනිමය ප්‍රමාණයක් වාර්ෂිකව වැය කිරීමට සිදුවීමයි. මෙම භෝගවල දේශීය නිෂ්පාදනය වැඩි කිරීමෙන් ආනයනය සීමා කර විදේශ විනිමය ඉතිරි කර ගැනීම රජයේ බලාපොරොත්තුව විය. ඇතැම් අතිරේක ආහාර බෝග අපනයනය මගින් විදේශ විනිමය උපයා ගැනීමත්, ගොවි පවුල්වල ආදායම් මට්ටම ඉහළ නැංවීමත් මෙම බෝග වගා වැඩ පිළිවෙලෙහි අරමුණු අතර විය. එමෙන් ම අතිරේක ආහාර බෝග වගාව සඳහා වන ජල අවශ්‍යතාව සාපේක්ෂව වී වගාව සඳහා වන ජල අවශ්‍යතාවට වඩා අඩු නිසා, ජලය හිඟ කාලවලදී, විශේෂයෙන්ම යල කන්නයේදී, ජලය හා ඉඩම් කාර්යක්ෂම ලෙස ප්‍රයෝජනයට ගැනීමට ද මෙම භෝග විවිධාංගීකරණයේ තවද අරමුණක් විය.

කෙසේ වුව ද වාරි ඉඩම්වල වී පමණක් වගා කිරීමට පුරුදුව සිටි වියළි කලාපයේ ගොවීන්ට, විශේෂයෙන් ම ගොවි ජනපදවාසීන්ට කුඹුරු ඉඩම්වල අතිරේක ආහාර භෝග වගාව අලුත් අත්දැකීමක් විය. මේ නිසා භෝග විවිධාංගීකරණය හඳුන්වා දුන් මුල් කාලයේදී ගොවීන් එයට යහපත් ප්‍රතිචාරයක් නොදැක්වූ බව කිව යුතුය. එහෙත් කල් ගතවත්ම මෙය ගොවීන් අතර බෙහෙවින් ජනප්‍රිය වන්නට පටන් ගත්තේය. මෙයට ප්‍රධාන හේතුව වූයේ අතිරේක ආහාර භෝග, විශේෂයෙන්ම මිරිස් හා ලූනු වගාව වී වගාවට වඩා ලාභදායක වීමත් මේ වන විට වී වගාව ආන්තික වගාවක් බවට පත්ව තිබීමත් ය. මේ ආකාරයට භෝග විවිධාංගීකරණය ව්‍යාප්ත වීමත් සමගම කුඹුරු ඉඩම්වල වගා ළිං ඉදි කර ගැනීමෙන් හා ස්වාභාවික ජල මාර්ගවලින් නල මාර්ගයෙන් ජලය ලබා ගැනීමෙන් යල කන්නයේ කුඹුරු ඉඩම්වල අතිරේක භෝග වගා කිරීමේ ප්‍රවණතාවක් රජරට ප්‍රදේශයේ ගොවි ජනපදවල ඇති විය. යල කන්නයේ වී වගාව සඳහා ප්‍රමාණවත් තරම් වාරි ජල පහසුකම් තිබූ අවස්ථාවල පවා වී වගා නොකොට අතිරේක භෝග වගා කිරීමට තරම් ගොවීන්ගේ ආකල්පවල වෙනසක් 80 දශකයේ අග භාගය වන විට ඇති වී තිබුණි.

## අධ්‍යයනයේ පරමාර්ථය

යල් කන්නයේදී ඉඩම්වල අතිරේක භෝග වගාකිරීම කෙරේ. ජලය හිඟ වීමත්, භූමියෙහි වියලි ස්වභාවයක් පැවතීමත් නිසා කුඹුරු ඉඩම් වීවලට වඩා අනෙකුත් භෝග සඳහා සුදුසු තත්ත්වයකට පත්වේ. යල කන්නයේ වීවගාව සඳහා ප්‍රමාණවත් ජලය නොලැබෙන අවස්ථාවලදී ගොවීහු "බෙත්ම" නම් පාරම්පරික කෘෂි රටාවකට අනුව ගොවිතැන් කළහ. මෙම ලිපියේ අරමුණු වන්නේ, විවිධාංගීකරණය යටතේ ගොවීන් අතිරේක භෝග වගාව කෙරෙහි නැඹුරු වෙද්දී එය බෙත්ම ක්‍රමය කෙරෙහි බලපෑමක් ඇති කළේද, නැද්ද යන්න තෝරා ගනු ලැබූ ප්‍රදේශයක් ඇසුරින් විමසා බැලීමය.

## ක්‍රමවේදය

### අධ්‍යයනය සඳහා තෝරාගත් ප්‍රදේශය

මහවැලි "එච්" කලාපයේ ගල්නෑව කොට්ඨාශයට අයත් අමුණුගම මෙම අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලදී. මෙය බුල්නෑව - ඇඳගල මාර්ගයේ, බුල්නෑවේ සිට කිලෝමීටර් 3ක් දුරින් පිහිටා ඇත. මෙම ගම්මානය මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය යටතේ 1980දී පිහිටුවන ලද්දකි. එහි ගොවි පවුල් 89ක් පදිංචි කරනු ලැබ ඇත. සමහර ගොවීන් ප්‍රදේශයේ මුල් පදිංචිකරුවන් වන අතර අනෙක් අය පිට පළාත්වලින් පැමිණි ඉඩම් ලාභීහු වෙති. ගම් වැසියන්ගෙන් 80%ක් පමණ දෙනකුට කුඹුරු අක්කර 2 2/1ක් හා ගොඩ ඉඩම් අක්කර 1/2ක් බැගින් ලබා දී ඇති අතර ඉතිරි අයට ලබා දී ඇත්තේ ගොඩ ඉඩම් අක්කර භාගය පමණි.

## දත්ත රැස් කිරීම

දත්ත ලබා ගැනීම සඳහා කුඹුරු ඉඩම් හිමි ගොවීන් පනස් දෙදෙනෙක් තොරා ගන්නා ලදී. දත්ත රැස් කිරීම ප්‍රධාන වශයෙන් කරන ලද්දේ ගොවිපළ සමීක්ෂණයක් මඟිනි. මේ සඳහා ප්‍රශ්නාවලියක් යොදාගත් අතර ගොවීන් සමඟ පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවලදී අදාළ තොරතුරු ලබා ගන්නා ලදී. මීට අමතරව ගොවි සංවිධානයේ නිලධාරීන්ගෙන් හා ඒකක කළමණාකරු ඇතුළු ක්ෂේත්‍ර නිලධාරීන්ගෙන්ද, ක්ෂේත්‍රයේ කළ නිරීක්ෂණවලින් ද අවශ්‍ය තොරතුරු රැස් කර ගන්නා ලදී.

### බෙත්ම ක්‍රමය

බෙත්ම ක්‍රමය වූ කලී වියලි කලාපයේ ගොවීන් විසින් අතීතයේ පටන් භාවිතා කෙරුණු පාරම්පරික කෘෂි රටාවකි. යල් කන්නයේ ආරම්භයේ දී කිසියම් වැවක ඇති ජල ප්‍රමාණය එම වැව යටතේ ඇති සියලුම ඉඩම් වගා කිරීම සඳහා ප්‍රමාණවත් නොවූ කල වැවට ආසන්නයේ තෝරාගත් කුඹුරු ඉඩම් ප්‍රමාණයක් ගැමියන්ගේ ඉඩම් හිමිකමේ අනුපාතය අනුව බෙදාගෙන වගා කිරීම බෙත්ම ක්‍රමය යන්නෙන් අදහස් කෙරේ. කහඳගමගේ (1997) විග්‍රහ කරන ආකාරයට බෙත්ම ක්‍රමයේ ආකාර තුනක් දක්නට ලැබේ. මින් පළමුවැන්න **ඉරවැලි බෙත්ම** නම් වන අතර ඉන් අදහස් කරනුයේ යායේ මුල සිට අග දක්වා කුඹුරුවලින් සෑම එකකින් ම සමාන බිම් ප්‍රමාණය බැගින් වෙන් කරගෙන වගා කිරීමයි. දෙවැන්න පෙරලුම් බෙත්ම නම් වේ. මෙහිදී යායේ ඉහළ කුඹුරු හිමියන්ට පහළ කුඹුරුවලින් ද පහළ ඉඩම් හිමියන්ට ඉහළ කුඹුරුවලින් ද කොටස් හිමිවන ආකාරයට ඉඩම් බෙදාගෙන සියලුම දෙනා විසින් සමාන බිම් ප්‍රමාණයක් වගා කිරීම සිදු කෙරේ. තෙවැන්න සම බෙත්ම නම් වේ. වැවේ ඇති ජල ප්‍රමාණය අනුව යායේ ඉහළ බිම් කොටසක් තෝරාගෙන එය ගොවීන් හවුලේ වගාකොට ලැබෙන අස්වැන්න සමසේ බෙදා ගැනීම මින් අදහස් කෙරේ. බෙත්ම ක්‍රමයේදී ගැමියන් ඉඩම් හා ජලය සාධාරණ ලෙසට බෙදා ගෙන පාරිභෝජනය කළ අතර මෙය වියළි හා ආහාර හිඟ කාලවලදී ගැමියන්ට ජීවිතය පවත්වාගෙන යාමට ඉවහල් විය (ෆාමර්, 1957). පුරාණ ගම්වල ජීවත් වූවන් නෑදෑකම් සිරිත් විරිත් ආදිය නිසා එක ම කණ්ඩායමක් ලෙසට ක්‍රියා කළ අතර ගැමියන්ගේ එකමුතුකම බෙත්ම ක්‍රමයෙන් ද පිළිඹිබු විය.

බෙත්ම ක්‍රමය වාරි ජලය ඉතිරි කර ගැනීමට හා අරපිරිමැස්මෙන් යුතුව භාවිත කිරීමට ඉවහල් වේ. මේ නිසා ෆාමර් විසින් බෙත්ම ක්‍රමය හඳුන්වන ලද්දේ නුවණක්කාර සිරිතක් වශයෙනි. බෙත්ම ක්‍රමයට වගා කිරීමේදී ගොවීන් කොටස් දෙකකට වර්ග කළ හැකිය. ඒකනායක හා ග්‍රොඑන්ෆෙල්ඩ් (1990) නම් කරන ආකාරයට ඔවුහු සත්කාරක ගොවීහු හා ආගන්තුක ගොවීහු වෙති. සත්කාරක ගොවීහු කන්න රැස්වීමේදී පැමිණෙන එකඟකම මත සිය ඉඩම්වලින් කිසියම් බිම් ප්‍රමාණයක් බෙත්ම ක්‍රමයට වගා කිරීම සඳහා ආගන්තුක ගොවීන්ට පවරති. බෙත්ම ක්‍රමය සාමාන්‍යයෙන් භාවිතා කරන ලද්දේ වැවකින් අස්වද්දනු ලබන කුඹුරු ඉඩම් වගා කිරීම සඳහා ය. එසේ වුවද මහා වාරිමාර්ග යෝජනා ක්‍රමවලදී ද ඇතැම් විට යල කන්නයේ ජල සැපයුම මුළු ඉඩම් ප්‍රමාණය ම වගා කිරීමට ප්‍රමාණවත්

නොවන කල බෙත්ම ක්‍රමය අනුගමනය කරනු දැකිය හැකි වේ (මොරගොඩ හා ග්‍රොඑන්ෆෙල්ඩ් 1990). මේ අනුව අතිරේක භෝග වගාව බෙත්ම ක්‍රමය යටතේ සිදු කරනු ලැබේ. මහා වාරිමාර්ගවල ද බෙත්ම ක්‍රමය සාර්ථකව ක්‍රියාත්මක වූ බව දේවනුව හා මහවැලි එච් කලාපයේ කරන ලද පර්යේෂණවලදී පෙනී ගොස් ඇත. (මොරගොඩ හා ග්‍රොඑන්ෆෙල්ඩ් 1990 : ඒකනායක හා ග්‍රොඑන්ෆේල්ඩ් 1990).

## අමුණුගම අත්දැකීම්

1997 යල කන්නයේ ගල්නෑව කොට්ඨාස සඳහා පැවැත්වූ කන්න රැස්වීමේදී කලා වැවේ පිහිටි ජල ප්‍රමාණය සැලකිල්ලට ගනිමින් එකී කන්නය සඳහා බෙත්ම ක්‍රමය ක්‍රියාත්මක කිරීමට තීරණය කෙරිණි. මෙහිදී එක් ගොවියෙකුට අක්කර 1 1/2 ක් සඳහා භෝග (අතිරේක) වගා කිරීමට ජලය නිකුත් කරන බව ප්‍රකාශ කෙරුණු අතර බෙත්ම ලැයිස්තුවක් පිළියෙල කර ඉදිරිපත් කරන ලෙසට ගොවි සංවිධානවලට උපදෙස් දෙන ලදී. බෙත්ම ඉඩම් ගොවීන්හට බෙදා දීමේදී මහවැලියේ ඒකක කළමණාකරු හෝ වෙනත් ක්ෂේත්‍ර මට්ටමේ රජයේ නිලධාරියෙකු හේ මැදිහත් නොවූ අතර එම කාර්යය ගොවීන්ට ම (එනම් ගොවි සංවිධානවලටම) පවරන ලදී.

අප තෝරාගත් අධ්‍යයන සාම්පලයේ ගොවීන් පණස් දෙදෙනෙකු වූ අතර ඉන් ගොවීහු විසිහතර දෙනෙක් සත්කාරක ගොවීහු වූහ. විසිඅට දෙනෙක් ආගන්තුක ගොවීහු වූහ. රැස් කරන ලද තොරතුරු අනුව ආගන්තුක ගොවීන් නැවත කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය. එනම්, ලබා දුන් බෙත්ම ඉඩම් වගා කළ ගොවීන් හා බෙත්ම ඉඩම වගා නොකළ ගොවීන් යනුවෙනි. සත්කාරක ගොවීන් සියලු දෙනාම තමන්ගේ බෙත්ම ඉඩම් වගා කර තිබිණි. මෙම නිරීක්ෂණයන් වගු අංක 1 හි සම්පිණ්ඩනය කර ඇත.

### 1997 යල කන්නයේ බෙත්ම ක්‍රමයට වගා කිරීම

| වගා කළ | | වගා නොකළ | එකතුව |
|---|---|---|---|
| සත්කාරක ගොවීහු | 24 | - | 24 |
| ආගන්තුක ගොවීහු | 21 | 7 | 28 |

වගු අංක 1

වගුවෙහි දැක්වෙන ආකාරයට ආගන්තුක ගොවීන්ගෙන් සත් දෙනෙකු ඔවුනට ලබාදෙන ලද බෙත්ම ඉඩම් වගා නොකළ බව පෙනේ. යල කන්නයේදී මුල් ඉඩම් ප්‍රමාණය වගා කිරීමට නොහැකියාව තිබෙද්දීත් වාරි පහසුකම් ඇතිව ලබා දෙන බෙත්ම ඉඩම්

ප්‍රමාණයද සැහෙන ගොවීන් පිරිසක් විසින් වගා නොකර අත්හැරීම සැලකිල්ලට ගත යුතු කරුණකි. මේ නිසා ලබා දුන් බෙත්ම ඉඩම් වගා නොකළ ආගන්තුක ගොවීන්ගෙන් ඊට බලපෑ හේතු කවරේදැයි විමසන ලදුව එම ගොවීන් විසින් විවිධ හේතු දක්වන ලදී. ගොවීන්ගේ එකී අදහස් වගු අංක 2 හි දැක්වේ.

**බෙත්ම කට්ටිය වගා නොකිරීමට හේතු**

| ගොවීන් ඉදිරිපත් කළ හේතුව | ගොවීන් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| 1. සත්කාරක ගොවීන් බෙත්ම කට්ටි ලබා දීම ප්‍රතික්ෂේප කිරීම | 3 | 43% |
| 2. වගාවට එතරම් සුදුසු නැති බිම් කොටස් ලබා දීම | 2 | 29% |
| 3. බෙත්ම ඉඩමට ඇති දුර | 1 | 14% |
| 4. වාරි ජලය ප්‍රමාණවත් නොවේ යැයි සිතීම | 1 | 14% |

වගු අංක 2

මේ අනුව බෙත්ම ඉඩම් වගා නොකළ ආගන්තුක ගොවීන්ගෙන් වැඩිදෙනා (43%ක් පමණ) එසේ කර ඇත්තේ සත්කාරක ගොවීන් තම ඉඩමින් බෙත්ම කොටස ලබාදීම ප්‍රතික්ෂේප කිරීම නිසා බව පෙනේ. බෙත්ම සඳහා තෝරාගනු ලබන ඉඩම්වලට ජලය සපයන බැවින් සත්කාරක ගොවීන් තම ඉඩම් පවුලේ ඥාතීන් අතර බෙදා ගන්නා අතර නීත්‍යානුකූලව එය ලැබිය යුතු අයට ලබා නොදෙන බව ද සමීක්ෂණයේ දී හෙළි විය. බෙත්ම ක්‍රමය පවත්වා ගෙන යාමේ වගකීම ගොවි සංවිධානවලට ලබා දී ඇති මුත් එකී සංවිධානවලට බෙත්ම ක්‍රමය කඩ කරන ගොවීන්ට විරුද්ධව ක්‍රියා කිරීමට බලතල නොමැති නිසා සමහර අවස්ථාවලදී ආගන්තුක ගොවියන්ට බෙත්ම ක්‍රමය යටතේ ලැබෙන්නේ සත්කාරක ගොවීන්ගේ ඉඩම්වල ඇති වගාවට එතරම් යෝග්‍ය නැති නිසරු බිම් කොටස්ය (උදා : ජලය රැඳෙන වගල් ප්‍රදේශ). මේවා මිරිස් වැනි භෝග වගා කිරීම සඳහා යෝග්‍ය නොවේ. යල කන්නයේදී බොහෝ විට ගොවීන් බලාපොරොත්තු වන්නේ මිරිස්, ලූනු වැනි වැඩි ලාභ දෙන භෝග වගා කිරීම නිසා මෙවැනි වගාවට යෝග්‍ය නොවන බිම් කොටස් ලැබුණු විට බිම් වගා නොකර අතහැර දැමීමට ගොවීහු පෙළඹෙති. මීට අමතරව බෙත්ම ක්‍රමයට අනුව (1997 යල කන්නයේ) එක ගොවියෙකුට අක්කර එක හමාරක් හිමි විය යුතු නමුත් ඇතැම් අවස්ථාවලදී ආගන්තුක ගොවීන්ට ලැබෙන්නේ ඊට වඩා අඩු බිම් ප්‍රමාණයකි. සත්කාරක ගොවීහු වැඩි කොටසක් වගා කිරීමට උත්සාහ දරති. මෙවැනි අවස්ථාවලදී ගැටලු සහගත තත්ත්වයක් උද්ගත වන අතර, එය බෙත්ම ක්‍රමය නිසිලෙස පවත්වාගෙන යාමට අවහිරතා ඇති කරයි.

බෙත්ම ක්‍රමයට ඉඩම් වෙන් කිරීමේ දී සමහර ගොවීන්ට ලැබෙන බෙත්ම කට්ටිය ගොවීන්ගේ නිවසේ සිට සෑහෙන දුරකින් පිහිටා ඇති අවස්ථා අපට නිරීක්ෂණය කළ හැකි විය. උදාහරණයක් ලෙසට අධ්‍යයනය සඳහා අප තෝරාගත් එක් ගොවි මහතෙකුට (ආගන්තුක ගොවියෙකු) අයත් බෙත්ම ඉඩම පිහිටා තිබුණේ කිලෝමීටර් 2 කට වඩා දුරකිනි. වගා කටයුතු කරගෙන යාමේදී ගොවියා නිතරම ක්ෂේත්‍රයේ සිටීමත් බෝගවලට සාත්තු කිරීමත් අවශ්‍ය වේ. එමෙන්ම අස්වනු නෙළන කාලය එළඹෙත්ම ඒවා වඩා හොඳින් රැක බලා ගැනීමද අවශ්‍ය වේ. මේ නිසා දුර බැහැරින් බෙත්ම කට්ටිය ලැබුණු විට ආගන්තුක ගොවීහු ඒවා වගා කිරීමට මැලිකමක් දක්වති. ඒ වෙනුවට ඔවුහු සිය නිවසට කිට්ටුව පිහිටි වාරි ජල පහසුකම් ඇති ඉඩම් හිමි ගොවීන්ගෙන් අතිරේක භෝග වගාව සඳහා බිම් කොටස් බද්දට ලබා ගනිති. අමුණුගම ප්‍රදේශයේ මේ සඳහා භාවිතා කරන ක්‍රමය වන්නේ ලියද්දේ ප්‍රමාණය අනුව කන්නයක් වගා කිරීම සඳහා ලියද්දට රුපියල් 200/= - 400/= ක බදු මුදලක් ගෙවීමයි. මේ ආකාරයට සමහර ගොවීන් අතිරේක බෝග වගාව සඳහා ඉඩම් බද්දට ගැනීමට තැත් කරන නිසා එය ආගන්තුක ගොවීන්ට බෙත්ම ඉඩම් ලබා නොදීමට සත්කාරක ගොවීන් පොළඹවන හේතුවක් වී ඇති බව සඳහන් කළ යුතුය.

ඒකනායක හා ග්‍රොරන්ෆෙල්ඩ් (1990) පෙන්නා දෙන පරිදි මහා වාරිමාර්ග ක්‍රමවලදී වුව සමහර අවස්ථාවලදී බෙත්ම සඳහා වන ජල සැපයුම ස්ථායි නොවේ. මේ නිසා සමහර ගොවීහු යල කන්නයේ අතිරේක බෝග වගා කිරීම සඳහා තමන්ගේ කුඹුරුවල වගා ළිං ඉදිකිරීමටත් වතුර පොම්ප භාවිතා කිරීමටත් පෙළඹී සිටිති. අමුණුගම කුඹුරු යායේ විවිධ ප්‍රමාණයට ඉදි කළ වගා ළිං රැසක්ම දක්නට ලැබුණි. වගා ළිං හා වතුර පොම්ප හිමි ගොවීන් එම පහසුකම් භාවිතා කර තම තමන්ගේ අභිමතය පරිදි යල කන්නයේ අතිරේක භෝග වගා කරන බව පැහැදිලි කරුණකි. අමුණුගම සිට කිලෝ මීටරයක දුරින් කලාඔය ගලා බස්නා බැවින් අමුණුගම ඇතැම් ගොවීන් ඔයෙන් ජලය පොම්ප කර කලාඔය දෙපස රක්ෂිත ඉඩම් අනවසරයෙන් වගා කිරීම ද සුලභව දැකියහැකිය. යල කන්නයේදී වුව කලාඔයේ ජලය හිඟ නොවීමත් රක්ෂිත ඉඩම්වල අතිරේක භෝග වර්ග හොඳින් වර්ධනය වීමත් රක්ෂිතයේ තමන් වගා කරන කොටසේ ඉඩම් හිමිකම යම් දිනක තමන්ට ලැබේයැයි ඔවුන් තුළ පවත්නා විශ්වාසයත් නිසා ඔවුහු අනවසර වගාවේ නිරත වී සිටිති. වගා කටයුතු කර ගෙන යාම සඳහා ඔය දෙපස කුඹුක් කෝන් වැනි විශාල ගස් වර්ග ද කපා දමා ඇත. අතිරේක භෝගවලට අමතරව කෙසෙල් පොල් වැනි වගා ද කරගෙන යන අතර පැල්පත් ද ඉදිකර ඇති බව දක්නට ලැබේ. මේ නිසා ඔය දෙපස ඉඩම් සෝදා පාලුවට ලක් වී ඇති අතර ඉවුරුවලට හානි සිදුවී ඇත. එමෙන් ම කුඹුරු ඉඩම්වල වගා ළිං ඉදිකිරීම නිසා භූගත ජල මට්ටම පහළ බැස ලවණතාව අධික වී එම ඉඩම්වල ඵලදායිතාව අඩු වීමට ද බෙහෙවින් ඉඩ තිබේ.

සමීක්ෂණයේදී හෙළි වූ කරුණුවලට අනුව භෝග විවිධාංගීකරණයේදී අමුණුගම ගම්මානයේ බෙත්ම ක්‍රමය නිසි ලෙස ක්‍රියාත්මක නොවේ. මෙය ඒකනායක හා ග්‍රොඑන්ෆෙල්ඩ් (1990) යන අය මහවැලි එච් කලාපයේ දී බෙත්ම ක්‍රමය සම්බන්ධයෙන් කළ නිගමනයන්ට පටහැණිය. වගා ළිං හා ජල පොම්ප භාවිතා කිරීමට පටන් ගැන්ම මේ සඳහා බලපා ඇති බව දක්නට ලැබුණද අමුණුගම ගම්මානයේ වූ විවිධාකාර සමාජ - ආර්ථික කරුණුද මීට හේතුවී ඇත. අතීතයේදී වැව් යටතේ බෙත්ම ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී එය වී වගාව සඳහා පමණක් සීමා වූ අතර ගම් වැසියන් බෙත්ම ඉඩම් බෙදාගැනීමේදී ගැටලු සහගත තත්ත්වයක් ඇති නොවිණි. මෙයට මූලික හේතුව වූයේ ගැමියන් බොහෝ විට ඥාතීන් වීමත් ඔවුන් අතර මනා එකමුතුකමක් තිබීමත්ය. එහෙත් අමුණුගම වැනි මහා වාරි යෝජනා ක්‍රමයක ගමක් ගත් කල එහි ජීවත්වන ගොවීන් විවිධ

ප්‍රදේශවලින් පැමිණියවුන් වන අතර ඔවුන් අතර විවිධ කුල ප්‍රශ්න, දේශපාලන භේද, පංති භේද හා පෞද්ගලික ප්‍රශ්න ද පවතී. ඔවුන්ගේ අදහස් ද විවිධාකාර වේ. මේ නිසා බෙත්ම ඉඩම් බෙදීමේදී හා වගා කිරීමේදී ගැටලු උද්ගත වේ. එමෙන්ම පැරණි වෙල් විදානේ ක්‍රමය පැවැති අවධියේදී වෙල් විදානේවරයාට හිමි වූ නීතිමය බලතල යටතේ බෙත්ම ක්‍රමයට පටහැනිව කටයුතු කරන ගොවීන්ට විරුද්ධව ක්‍රියා කිරීමට හැකියාව තිබිණි. මේ නිසා සාමූහිකව තීරණය කර ගත් ආකාරයට බෙත්ම ක්‍රමය කරගෙන යාමට ගොවීහු සියලුමදෙනා උත්සාහ කළහ. එහෙත් අද ක්‍රියාත්මක වන ගොවි සංවිධාන සතුව එවැනි බලතල නැති අතර බෙත්ම ඉඩම් ප්‍රමාණය ඉක්මවා වගා කරන ගොවීන්ට හෝ ආගන්තුක ගොවීන්ට ඉඩම් ලබා දීම පැහැර හරින සත්කාරක ගොවීන්ට හෝ විරුද්ධව ක්‍රියා කිරීමට හා දඩුවම් පැමිණවීමට හැකියාවක් මෙම සංවිධාන සතු නොවේ. විවිධ භේද නිසා ගොවීන් අතර සාමූහිකත්ව හැඟීම තුරන් වී ඇති බැවින් ඇතැම් ගොවීන් තනි තනිව කටයුතු කිරීමට උත්සාහ කරනු දැකිය හැකිය. මේ ආදී හේතූන් නිසා ජලය හිඟ කාලවලදී එය අරපිරිමැස්මෙන් සියලුදෙනාටම සාධාරණ ලෙසට පරිභෝජනය කිරීමට උපකාරි වූ, ෆාමර් (1957) විසින් "නුවණක්කාර සිරිතක්" ලෙසට හඳුන්වන ලද බෙත්ම ක්‍රමය අද ව්‍යාකූල තත්ත්වයට පත්ව ඇත.

**නිගමනය**

අමුණුගම ප්‍රදේශයේ සිදු කරන ලද අධ්‍යයනයේදී නිගමන කිහිපයකට එළඹිය හැකි විය. කුඹුරු ඉඩම්වල භෝග විවිධාංගීකරණයේදී පාරම්පරික බෙත්ම ක්‍රමය නිසි පරිදි ක්‍රියාත්මක නොවන බව පෙන්වා දිය හැකිය. තමාගේ ඉඩම් බෙත්ම ක්‍රමය යටතේ අනෙක් ගොවීන් සමඟ බෙදාගෙන වැඩ කිරීමට සමහර ඉඩම් හිමියන් දක්වනුයේ අකමැත්තකි. ඇතැම් ගොවීන් තමන්ට ලැබෙන බෙත්ම ඉඩම් වගා නොකර අත්හැර දැමීමේ ප්‍රවණතාවක් ද දක්නට ලැබේ. යල කන්නයේදී ඇතැම් විට වාරි යෝජනා ක්‍රමවලදී වුව ජල සැපයුම ප්‍රමාණවත් නොවන නිසා වගා ළිං හා වතුර පොම්ප භාවිතය මගින් සිය ජල අවශ්‍යතා සපුරාගන්නා ගොවීහු බෙත්ම ක්‍රමය නොසලකා හරිමින් තම අභිමතය පරිදි වගා කටයුතු කරති. බෙත්ම ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ වගකීම ගොවි සංවිධානවලට පවරා තිබුණ ද ඒ සඳහා අවශ්‍ය බලතල එකී සංවිධාන සතුව නොමැති බැවින් අපේක්ෂිත වූ අරමුණු ඉටුනොවන වන බවද කිව හැකිය. එමෙන් ම වාරි යෝජනා ක්‍රමවල උද්ගත වී ඇති සමාජ - ආර්ථික විෂමතා ද මේ සඳහා බල පා ඇති බව පෙනී යයි.

අමුණුගම ගම්මානයේ අත්දැකීම්වලට අනුව භෝග විවිධාංගීකරණය හේතුවෙන් ඇති වූ බෙත්ම ක්‍රමයේ වෙනස් වීම පරිසර දූෂණයට ද හේතුකාරකයක් වී ඇති බව කිව යුතුය.

වාරියෝජනා ක්‍රමවල දක්නට ලැබෙන ජල හිඟයට පිළියමක් වශයෙනුත් ජලය හා වගා බිම් කාර්යක්ෂමව භාවිත කිරීමේ උපක්‍රමයක් ලෙසත් බෙත්ම ක්‍රමය නිසි ලෙස පවත්වා ගෙන යාම අත්‍යවශ්‍යයෙන්ම කළ යුත්තකි. මෙහිදී ගොවි සංවිධාන ශක්තිමත් කිරීමත් ඒවාට අවශ්‍ය බලතල ලබා දීමත් ඉතා වැදගත් වේ. මේ මගින් බෙත්ම ක්‍රමය නොසලකා හරින ගොවීන්ට එරෙහිව කටයුතු කිරීමට මෙන්ම බෙත්ම ආරවුල් විසඳීමට ද එකී සංවිධානවලට හැකියාව ලැබේ. විධිමත් ගොවි සංවිධාන මගින් ඇළ වේලි නඩත්තුවත් මනා ජල පාලනය මෙන් ම විවිධ කරුණු කෙරෙහි ගොවියන් දැනුවත් කිරීමත් කළ හැකි වේ. මෙමගින් වාරියෝජනා ක්‍රමවල ඇති වන පාරිසරික ගැටලු නිරාකරණය කර ගැනීමට ද පිටුවහලක් ලැබේ.

## References


Department of Census and Statisics (1997). **Paddy Statistics of Sri Lanka.** Colombo.

Ekanayaka, R and Groenfeldt, D. (1990). **"Organizational Aspects of Improved Irrigation Management : An Experiment in Dewahuwa Tank, Sri Lanka".** International Irrigation Mangement Institute. Working Paper No.17.

Farmer, B.H. (1957). **Pioneer Peasant Colonization in Ceylon : A Study in Asian Agrarian Problems.** Greenwood press. UK.

Kahandagamage, P. (1997). **Kethaka Mahima - Kumbura**. S. Godage and Brothers. Colombo.

Moragoda, R and Groenfeldt,D. (1990). **"Organizational Aspects of Improved Irrigation Management : Kalankuttiya Block, Mahaweli System H, Sri Lanka".** International Irrigation Management Institute. Working Paper No. 19.